**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය - 2018.**

**--------------------------------------------------**

කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස් ආර් අයි (එස් එෆ්) දරන ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්යාපෘති කාලය**

**-----------------------------------------------------------------------------------------**

ව්‍යාපෘති ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන්නේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වේ. ශක්‍යතා අධ්‍යයන සංවර්ධනය, ප්‍රවාහන ව්‍යාපෘති සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලැසුම් සකස් කිරීම සහ ප්‍රවාහන ව්‍යාපෘති සඳහා සහාය ලබාදීමට ප්‍රතිපාදන ඇතිකිරීම වැනි කාර්යයන් ඇතුලත්ව ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,853 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 11.36 ක් වේ. ඉන් රු. මිලියන 1,405.06 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 9.69 ක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ඇත. ශේෂ අගය වන රු. මිලියන 447.94 ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

**1.3 තත්ත්වාගණනය කළ මතය.**

**----------------------------**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම.**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම.**

**-----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමණාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩව පැවත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමණාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා ව්‍යාපෘතිය මගින් පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණන කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරනය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙණු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු.

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පවුල් නැවත පදිංචිකිරීමේ අරමුණෙන් යුතුව ව්‍යාපෘතිය මගින් නිවාස ඒකක 1,052 ක් ඉදිකිරීමට එළඹි අවබෝධතා ගිවිසුම් 05 යටතේ 2018 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු. මිලියන 2,545 ක මුදල ගිණුම්ගත කිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි. | අඩුවෙන් දැක්වීම | ඉදිකරන ලද නිවාසවල නීතිමය අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතියට පවරා නොතිබූ අතර මෙම ගෙවිය යුතු මුදල ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවබෝධතා ගිවිසුම්වල හෙළිදරව් කර ඇති පරිදි එම මුදල ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය මගින් යොදවන ලද උපදේශකයින්ගෙන් අයකර ගත යුතු රු.මිලියන 3.39 ක වටිනාකමින් යුත් ද්‍රවශීල හානි මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල ලෙස පෙන්වා තිබුණි. | ගෙවිය යුතු වියදම් වැඩියෙන් දැක්වීම | අදහස් දැක්වීම සමඟ එකඟවේ. | ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කිරීම අවශ්‍යය වේ. |

### 2.2 නීති,රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම.

| නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමණාකරන සේවා | මූලික ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 15 ට පහළින් පවත්වාගෙන යනු ලබන විදේශ අරමුදල් | චක්‍රලේඛ උපදෙස් වැරදි අර්ථකතනය කිරීම | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාර පසුගාමී මූල්‍ය සැලැසුම් හා ප්‍රතිපාදන ලැබීම | ව්‍යාපාතියේ කටයුතු සහ විෂයපථය පිළිබඳ සමාලෝචනය |

| | | | | |
|---|---|---|---|---|
| දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලවල වැටුප්තල 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ වගු අංක 01 හි පළමු ගණය යටතේ තීරණය කළ යුතුය. කෙසේ වෙතත්, 2018 මැයි 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එතැන් සිට ව්‍යාපෘතියේ ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 135 දක්වා වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය කර තිබුණි. එම තීරණය පදනම් කරගෙන ව්‍යාපෘතිය මගින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයේ වැටුප් වැඩිකිරීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති යෝජනාව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය විදේශ අරමුදල් ලබා ගැනීමට ව්‍යාපෘතිය මගින් කටයුතු කර නොතිබුණි. | | පදනම් කර ගෙන පවත්නා අරමුදල්වලින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් කර ඇති අතර ඒ අනුව අවශ්‍ය හැකියාවන් සහ සුදුසුකම් සහිත පුද්ගලයින් බඳවාගෙන ඇත. | කර සහ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය.

----------------------------

## 3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය.

----------------------------------------

කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා සැලැසුම් කිරීමේ අරමුණෙන් යුතුව උපදේශක සේවා සැපයීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාවට නගා ඇති අතර රු.මිලියන 379.21 කට සමාන යුරෝ 256,030 (ඇ.එ.ජ. ඩොලර් මිලියන 6.48) ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2017 දෙසැම්බර් 13 දින විදේශීය උපදේශක සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. ලැබී ඇති තොරතුරු අනුව හා 2018 දෙසැම්බර් 31 දිනට සපයා ඇති වාර්තා අනුව සැලැසුම් උපදේශකයින් විසින් සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව සම්පූර්ණ කර ඇත. තවද, සමාලෝචිත වර්ෂයේ අවසානයට කැළණිවැලි දුම්රිය මාර්ගයේ විස්තරාත්මක සැලැසුම් වැඩ සියයට 30 ක් සම්පූර්ණ කර ඇති අතර අවශ්‍ය මිණුම් කටයුතු නිමකර තිබුණි.